# මේ තිත්තයාගේ වාරයයි.

**පිල්ලෙයාන් පදනම් කරගෙන ජාතිවාදී ඇවිස්සීමකට දකුණ යොමු වෙන්නට පුළුවන්. දැනටමත් කොටුවේ බෝම්බ සිද්ධිය පිල්ලෙයාන් දෙසට හැරවීමට රනිල් උත්සාහ ගන්නව, අරන්තලාවේ භික්ෂු ඝාතනය පෙරුමාල්ට යොමු කළා වගේ.**

බඩු මිල බැස්සවීමට ක්‍රමයක් නෑ කිව්වත් සමාජවාදී නැත්නම් සමූපකාර ක්‍රමවලින් එයට පිළිතුරක් තිබෙන බව රජයම පිළිගන්න බව දැන් ක්‍රියා කරන ආකාරයෙන් පෙනෙනව.

රජය වැඩි වැඩියෙන් මැදිහත්වීමෙන් සහනයක් දෙන්න පුළුවන් කියන අදහස දැන් ඉදිරිපත් වෙලා තියෙනව. ප්‍රශ්නය

වන්නේ මේ වගේ ජාතිවාදී මිලිටරි රාජ්‍ය බලයකින් මේ මාර්ගයේ යන්න පුළුවන්ද කියන එකයි. එවැනි මිලිටරි බලයක් යෙදවීමෙන් මාර්ෂල් නීතිය මගින් පාලනය වන රටක මට්ටමට වැටෙනව. ඒත් අවශ්‍ය වන්නේ ජනතා බලය තුළින් බඩු බෙදාහැරීමට රුකුළක් ලබා ගැනීමයි.

ඒ සඳහා ජනතා සංවිධානවල බලය වැඩි කළ යුතුයි. අඩු තරමේ ප්‍රාන්ත සහ ප්‍රාදේශීය බලතලවල වැඩි වීමක් විය යුතුයි.

ඒත් ආණ්ඩුව යන්නේ ජනතා බලය පැත්තට නොව මිලිටරි හා මැර බලය පැත්තටයි. නැගෙනහිර ඡන්දයෙන් වුණත් ආණ්ඩුව තහවුරු කළේ මිලිටරි හා අතුරු මිලිටරි බලකාරයින්ට බලය පැවරීමේ ක්‍රියාමාර්ගයයි.

මහින්ද තමන්ට හිතවත් මිලිටරි බලකාරයින්ට ඉඩ දෙන්න ලැස්ති වුණත් ප්‍රභාට ඉඩ දෙන්න ලැස්ති නැත්තේ තමාගේ ආර්ථික සමාජ ගමනට ප්‍රභා එකඟ කරගන්නට බැරි නිසයි. මහින්ද වගේම විමල් වීරවංශත් කල්පනා කරන්නේ පිල්ලෙයාන් සිංහල බලයට යට වුණ දෙමළ රජෙක් කියලයි.

ඒත් දෙමළ තරුණයන්ගේ සන්නද්ධ බලයක් උඩ ඉන්න පිල්ලෙයාන්ට යන්න වෙන්නේ දෙමළ රැඩිකල් බලයට අනුවයි. එහෙම නැතිව සිංහල රජයට දණ්ඩ නමස්කාර කළොත් දෙමළ තරුණයන්ගෙන් කැරැල්ලක් ඇති වන එක නවත්වන්න පුළුවන් වෙන එකකුත් නෑ.

අනෙක් අතට පිල්ලෙයාන් දෙමළ බලයක් ලෙසට ක්‍රියාත්මක වන කොට එයට කොටි සංවිධානය විරුද්ධ වෙනවාටත් වඩා විරුද්ධ වෙනවා ඇත්තේ සිංහල උරුමය හා විමල් වීරවංශලායි.

එදා ජේආර් වර්ධරාජා සමඟ ඇති වුණ ගිවිසුමෙන් වර්ධාට ඇත්ත බලයක් ඇති කරගන්න බැරි වුණා. ඔහුට ලැබුණේ නාමික පට්ටමක් විතරයි. ඉංදියන් හමුදාව ළඟ සිටි නිසා ඒකට හේත්තු වෙලා හිටියත් ඇත්ත රාජ්‍ය බලයක් ඔහුට ලැබුණේ නෑ.

දැන් එයට වෙනස්. පිල්ලෙයාන් සන්නද්ධ හමුදාවක් සහිත දෙමළ මහ ඇමති කෙනෙක්. ඔහු බලාපොරොත්තු වෙන්නේ මේ සන්නද්ධ බලකායන්ම පොලිස් බලකායක් බවට පත් කරගන්න. එහෙම නැති වුණොත් තමන්ට යන්න වෙන්නේ වර්ධරාජාටත් වඩා පින්සෙන්ඩුවෙන් නිසා. ඒ තත්වයට යට වෙලා ඉන්න පිල්ලෙයාන් ක්‍රියා කරන බවක් එළි කරල නෑ.

මේ නිසා හැමෝම දැන් බලා ඉන්නේ මේ දෙමළ නායකයා අඩ අඩා පල්ලම් බහීවිද, නැත්නම් ඇත්ත සටනක් දේවිද කියලයි. මට නම් පෙනෙන්නේ පිල්ලෙයාන්ගේ තුවක්කුව මහින්දට එල්ල කරන්න වෙයි කියලයි.

උතුර මේ විදියට මිලිටරි සම්බෝලයක් බවට පත්වෙන කොට දකුණේ තත්වය කුමක් වෙයිද? පිල්ලෙයාන් පදනම් කරගෙන ජාතිවාදී ඇවිස්සීමකට දකුණ යොමු වෙන්නට පුළුවන්.

දැනටමත් කොටුවේ බෝම්බ සිද්ධිය පිල්ලෙයාන් දෙසට හැරවීමට රනිල් උත්සාහ ගන්නව, අරන්තලාවේ භික්ෂු සාතනය පෙරුමාල්ට යොමු කළා වගේ.

දැන් යම් බලයක් ලබා ගත්ත දෙමළා ගැන කැකෝ ගැසීම ජාතිවාදය ඇවිස්සීමේ හොඳ මාවත බව මේ අයත් තේරුම් ගෙන වගේ. ඒත් එදා වගේ දේශප්‍රේමී ජාතික ව්‍යාපාරයක් ගොඩනගන්නට බැරි වේවි. මොකද? එය දෙවන වටයේ නැත්නම් දෙවන මුද්‍රණයේ උණුසුමක් ඇති වෙයි කියල නොපෙනෙන නිසා.

ලෝකය පුරා වමේ විකල්ප ගැන අළුත් බලාපොරොත්තු මතු වෙද්දී ලංකාවේ විතරක් දේශප්‍රේමී මැදපංතික බලවේගය ශක්තිමත් වේවිද? මට හිතන්න අමාරුයි විමල් වීරවංශට බණ්ඩාරනායක තියා පිලිප් ගුණවර්ධනගෙ තත්වයවත් ලබාගන්නට පුළුවන් වේවි කියල.

මහින්දගේ අවතාරය හැටියට යම් කාලයක් වැජඹෙන්නට නම් පුළුවන් වේවි. එයිට එහා යන්නට බැරි වේවි කියලයි මගේ නම් තක්සේරුව.

**ජනතා විමුක්ති පෙරමුණට දැන් පරණ අරගලවල පිහිටෙන් ඉදිරියට යන්න බෑ. ආයෙත් එදා වගේ ත්‍රස්තවාදයට බහින්නත් බෑ. මේ අපූරු ගැටළුවට මුන්නැහේලා හොයාගත්ත පිළිතුර මොකක්ද?**

එතකොට ටිල්වින්ලා මොන පාරෙද යන්නේ? මේකයි ලොකුම ප්‍රශ්නය.

ඒ අයට, දැනට අසහනයට පත් වී සිටින ජනතාව වෙනුවෙන් කථා කරන්නට බලපෑමක් තියෙනව. ඇත්තටම මේ දෙගොල්ලො දෙබෑ වුණොත්, බඩගින්නද? - යුද්ධයද? යන ප්‍රශ්නය උඩනේ.

දැන් ටිල්වින්ලා යුද්ධය දෙවැනි තැනට දැම්ම නම් බඩගිනි ප්‍රශ්නය උඩ ජනතා වේදනාව එළියට ගැනීමේ වැඩට එන්න ඕනේ.

නැත්නම් වෙන්නේ විමල් යන මාර්ගයේම බැණ බැණ පස්සෙන් යන්න. එහෙම නැතිව වමට බර වුණොත් අපේ ගොඩට එකතු වුණා කියන චෝදනාවට බිළිවෙන එක නවත්වන්න බැරි වෙනව.

කොහොම වුණත් ජනතා විමුක්ති පෙරමුණට දැන් පරණ අරගලවල පිහිටෙන් ඉදිරියට යන්න බෑ. ආයෙත් එදා වගේ ත්‍රස්තවාදයට බහින්නත් බෑ.

මේ අපූරු ගැටළුවට මුන්නැහේලා හොයාගත්ත පිළිතුර මොකක්ද? දැනටමත් යම් යම් කොටස් ජනතා විමුක්ති පෙරමුණ හිර ගෙදරට දක්කන්න උත්සාහ ගන්නවා.

ජනතා අරගලයෙන් වෙන් කරන්න හොඳම ක්‍රමය ඒකයි. කොහොමටත් දැන් තිත්තයාගේ වාරය ඇවිත්. තිත්තයත් මේ වාරයවත් ප්‍රයෝජනයට ගනීවිද කියන ප්‍රශ්නයයි දැන් මතුවෙලා තියෙන්නේ.